# අපූරු මාලය

අනුදි වීරකෝන්

# අපූරු මාලය

අනුදි වීරකෝන්

කතෘ

පාසල :- මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඉගෙණුම ලබන පංතිය :-04 - C

කෘතිය පළ කරන දිනය :-2025.02.14

# පිදුම

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය.එසේනම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි . ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරවන  අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩනගන්නට  පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "**හොරණ ගත්කරණී**" ව්‍යාපෘතිය හදුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනීය සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර, පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හදුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනු මානය

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක කාලෙක සදුනි කියලා පුංචි ළමයෙක් හිටියා. අම්මාටයි, තාත්තාටයි හිටියේ එයා විතරයි. සදුනි හැමතිස්සෙම කල්පනා කරේ නංගියෙක් හරි මල්ලියෙක් හරි හිටියානම් කියලා.

එයා හිටියේ දුකෙන්, ඉතින් එයාව පාසලකට දැම්මා. එයාට අළුත් යාලුවෙක් හම්බවුනා එයාගේ නම ටිකිරි.

එයා දැන් දක්ෂ ළමයෙක් වුනා. දවසක් එයාලට විභාගයක් තිබුනා. ඉතින් දැන් සඳුනි උදෑසනින්ම නැගිටලා, බුදුන් වැදලා ලෑහැස්ති වුනා.

තාත්තා එයාව ඇරලවන්න ගියා. එයාගේ අංක පිළිවෙලට වාඩිවුනා. එයා හරි සතුටෙන් තමා හිටියේ.

විභාගය ඉවර වුනා. එයාව ගන්න තාත්තා ආවා. එයා කල්පනා කලා එයාට පලවෙනියා වෙන්න බැරිවෙයි කියලා එදා එයා රෑ කෑම කාලා නින්දට ගියා.

එයා උදෙන්ම නැගිට්ටා. අද ප්‍රථිපල එන දවස, ටක්, ටක් කවුදෝ දොරට තට්ටු කලා... තාත්තා දොර ඇරියා  ලියුම් මාමා තාත්තාට ලියුමක් දුන්නා..

එයා ඒක දිගහැරියා..ඒකේ සහතිකයක් ...මම කියෙවුවා ඒකේ ලියලා තිබුනේ පලවෙනි ස්ථානය වුනේ සදුනිටයි කියලා...

සදුනි සතුටට නැටුමක් නැටුවා ...තාත්තා එයාට තෑග්ගක් දුන්නා..ඒක ඇරියා .. ඒක ඇතුලේ මාලයක් තිබුනා.

සදුනි ඒක බෙල්ලට දැම්මා ඊට පස්සෙ මේක දිලිසෙන පාට පාටට හැරෙවෙනවා...

සදුනි අදින්නේ මොන පාටද ඒ පාටින් දිලිසෙනවා..දවසක් අපූරු දෙයක් වුනා.. එයාගේ මාලය ආකාසෙ රැදිලා මල් වැස්සක් වැස්සුවා....එදා ඉදන් මාලය අපූරු මාලයක් වුනා..... අපූරු මාලය නිසා එයාට නංගියෙකුත් හම්බ වුනා.. එදා ඉදන් එයා සතුටෙන් ජීවත් වුනා..